# ලංකා බැංකු සේවක සංගමය
# இலங்கை வங்கி ஊழியர் சங்கம்
# CEYLON BANK EMPLOYEES' UNION

ලියාපදිංචි අංකය
பதிவு இல :1151
**Registered No**

අංක 20, පන්සල පාර, කොළඹ 10. இல. 20, பன்சல வீதி, கொழும்பு 10, No. 20, Temple Road, Colombo 10
දුරකථන /தொலைபேசி/ Telephone:011-2693811/011-2674840, ෆැක්ස් /தொலைநகல்/ Fax: 011-2674840
E.Mail : cbeu@sltnet.lk, cbeu1@sltnet.lk, Web - www.cbeu.lk


(අභ්‍යන්තර විවරණිකාව - සාමාජිකයින් අතරේ පමණයි)

ප්‍රිය සහෝදරය/සහෝදරිය

පී.යු.2019/19

# බැංකු සේවක විශ්‍රාම වැටුප් ගැටලුවලට විසඳුම් තවදුරටත් ප්‍රමාදවන ලකුණු! සේවක සුභසාධන ප්‍රතිලාභවලටත් දැන් උපයන විට බදු

# වගකිවයුතු බලධාරීන් නිහඬයි සංගමය සටන් මගට!

රාජ්‍ය බැංකුවල 1996 න් පසු බැඳුණු සේවකයින්ට මේ වනවිට ස්ථාපිත කර ඇති විශ්‍රාම ක්‍රමවේදයන්හි පවතින ගැටලු නිරාකරණය කරන මෙන් ද, විශ්‍රාම හිමිකමක් නොමැති රාජ්‍ය බැංකුවල විශ්‍රාම ක්‍රමවේදයන් ස්ථාපිත කරන මෙන් ද ඉල්ලා ලංකා බැංකු සේවක සංගමය විසින් මුදල් අමාත්‍යංශය වෙත 2019 ජනවාරි මස සිය යෝජනා ඉදිරිපත් කරන ලදී. ඒ පිළිබඳව සියලු බැංකුවල පාලනාධිකාරීන් වෙත ලිඛිතවම දැනුවත් කිරීමට ද කටයුතුකර ඇත. නමුත් මේ දක්වා මුදල් අමාත්‍යංශය වෙතින් කිසිදු සාධනීය ප්‍රතිචාරයක් ලැබී නොමැත.

1996 වසරේ දී එවකට පැවති ආණ්ඩුව විසින් අහිමි කරන ලද රාජ්‍ය බැංකු විශ්‍රාම වැටුප මේ දක්වා **පිළිගත හැකි අයුරකින්** එම බැංකු තුළ ස්ථාපනය වී නොමැත. 1996 දී විශ්‍රාමය අහිමි කළ ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව තුළ ප්‍රාථමික මට්ටමින් විශ්‍රාම යෝජනා ක්‍රම ස්ථාපනය කර තිබුණත් එම විශ්‍රාම යෝජනා ක්‍රම යටතේ විශ්‍රාම ගොස් සිටින සේවකයින් වෙත විශ්‍රාම වැටුප ලෙස හිමිවන්නේ ජීවත්වීමට නොහැකි තරමේ සොච්චම් මුදලකි. ජීවත්වීමට ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක් ලබාගැනීමට නම් මෙම විශ්‍රාම යෝජනා ක්‍රම යථානුරූපී අයුරින් සංශෝධනය විය යුතුය.

එසේම, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (HDFC), ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව වැනි බැංකු ගණනාවකටම **කිසිදු විශ්‍රාම ප්‍රතිලාභයක් මේ වනතුරු හිමිව නොමැති අතර** එම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම තවමත් පවතින්නේ සාකච්ඡා මට්ටමේ පමණි. එම සාකච්ඡා පවා දිනෙන් දින කල් යමින්, කල් මරමින් පවතින හෙයින්, කිසිදු විසඳුමක් පේන මානයක හෝ නොමැත. මෙම **ප්‍රමාදය** එම බැංකුවල සේවය කරන, තව නොබෝ දිනකින් විශ්‍රාම යෑමට සිටින පළපුරුදු සේවක ප්‍රජාවට මෙන්ම, සිය වෘත්තීය ජීවිතයේ අනාගතය පිළිබඳව සුබවාදී බලාපොරොත්තු තබා සිටින නවක සේවක ප්‍රජාව වෙත ද ඉතිරිකර ඇත්තේ **සදාකාලික කලකිරීමක් සහ පසුතැවිල්ලක්** පමණකි.

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත හරහා **සේවක සුභසාධන** මත උපයනවිට ගෙවීමේ බදු (PAYE Tax)අයකිරීමට අදාළ නීතිමය ප්‍රතිපාදන සකසා ඇත. එම පනත අනුව යමින් මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ යොමු අංක MF/FP/13/CM/2018/82 සහ 2018-06-20 දින දරන ලිපිය අනුව ආදායම් කොමසාරිස් ජෙනරාල්වරයා නිකුත්කර ඇති උපයනවිට බදු ගෙවීම සඳහා වූ මූල්‍යමය නොවන ප්‍රතිලාභ ගණනය කිරීමේ උපදෙස් පත්‍රිකාවේ 04 අනු අංකය යටතේ සුභසාධක වරප්‍රසාද සේවකයාගේ ආදායමක් සේ සලකා බදු ගණනය කරන්නේ කෙසේ ද යන්න දක්වා ඇත. මේ යටතේ,

**සහන පොලී යටතේ සේවකයින්ට ලබාදී ඇති ණය-** වෙළඳ පොළ පොලිය සහ සහන පොලිය අතර වෙනසෙන් 50% ක් මාසිකව ගණනයකර එම ප්‍රමාණය සේවකයාගේ ආදායමක් සේ සලකනු ලබයි. මෙහි වෙළඳ පොළ පොලිය තීරණය කරනු ලබන්නේ දේශීය ආදායම් බදු කොමසාරිස් වරයාය. 2018/2019 බදු වසර සඳහා මෙම අගය 9.08කි. එය සැකසීමේ දී AWPLR (Average Weighted Prime Lending Rate) පාදකකරගෙන ඇත. මෙම ප්‍රතිශතයන් තීරණය කිරීමේ සම්පූර්ණ බලය දේශීය ආදායම් බදු කොමසාරිස්වරයා සතුය.

දැනට බොහෝ බැංකු, නිවාස ණය ඇතුළු අනෙකුත් ණයවලට මෙම බදු අයකිරීම සිදුකරනු ලබයි. ඇතැම් බැංකු, නිවාස ණය හැර අනෙකුත් ණය සඳහා ද මෙම බදු අයකිරීම සිදුකරනු ලබයි. **වෛද්‍යාධාර දීමනා, දුරකථන මාසික බිල්පත් සහ වාර්ෂික ගාස්තු, රාජකාරී නොවන ගුවන් ටිකට්පත්, උපයන විට බදු ආයතනය විසින් ගෙවූ මුදල, ආහාර දීමනා, මෙහෙකාර සේවා වියදම්, විදේශීය සේවකයින් සඳහා ගෙවන හෝටල් ගාස්තු** යනාදී මේ සියල්ල සැමදෙනාටම නොලැබුනත් ඒවා අදාළ සේවකයින්ට ලබාදෙනුයේ ඔවුන් බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රය වෙත ආකර්ශනය කර ගැනීම උදෙසා පිරිනමනු ලබන සුභසාධන වරප්‍රසාදයන් වශයෙනි.

ඉහත කී 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනත හරහා **නිල ඇඳුම් දීමනා, රාජකාරී නොවන විදේශ සංචාර හෝටල් ගාස්තු, මරණාධාර දීමනා, දූ දරු ශිෂ්‍යත්ව, නිදහස් ප්‍රවාහන ගාස්තු, අඩු මිලට ලබාදෙන භාණ්ඩ, තේ සඳහා ගාස්තු, සුභසාධක පදනම මත ලබාදෙන සංචාරක බංගලාවල සහන මිල, බදු සහන වාහන බලපත්‍ර** ආදිය ද සේවකයින්ගේ ආදායමක් සේ සලකා අනාගතයේ දී උපයන විට බදු සඳහා සලකා බැලෙන ආදායමට ඇතුළත් කිරීමට නියමිතව ඇත. අප වෘත්තීය සමිතියක් ලෙස උපයන විට ආදායම් බදු ගෙවීමට විරුද්ධ නොවෙමු. දැනටමත් උපයනවිට බදු නිසි පරිදි ගෙවමින් සිටිමු. 2018 වසරේ ඍජු ආදාම් බදු ලෙස රජය අයකරගත් රුපියල් බිලියන 430 කට ආසන්න ප්‍රමාණයෙන් රුපියල් බිලියන 27 (6%) ක් උපයන විට ගෙවන බදුය. මෙම බද්ද සේවා යෝජකයා විසින් නිසි පරිදි මාසිකව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට බැරකරනු ලබයි.

රජයේ නව ආදායම් බදු පනත මගින් සේවක සුභසාධන ප්‍රතිලාභ මත උපයන විට ගෙවීම් බදු පැනවීමට එරෙහිව අප සංගමය විසින් මීට පෙර ද, යම් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට එළඹි අතර එහි ප්‍රතිඵලයක් ලෙස එම බදු සඳහා සංශෝධනයන් සිදුකරන බවට මුදල් අමාත්‍යවරයා විසින් සිය වාචික එකඟතාව පළ කරන ලදී. ඉන්පසු සංගමය විසින් අවස්ථා ගණනාවක දී ඒ සම්බන්ධව නැවත ලිඛිත සිහිපත්කිරීම් සිදු කළ ද මේ වනතුරු කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත.

එබැවින්, **2019 අප්‍රේල් 04 දින** සංගමය විසින් මෙම කරුණු ද ඇතුළත්ව බැංකු ක්ෂේත්‍රයට බලපාන පොදු ගැටලු ගණනාවක් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යංශය ඉදිරිපිට දී විරෝධතාවක් පවත්වා මුදල් අමාත්‍යංශය වෙත සංදේශයක් භාරදීමට කටයුතු කළ අතර රජයේ මුදල් අමාත්‍යවරයා වෙනුවෙන් අමාත්‍යංශ බලධාරීන් එම සංදේශය බාරගත් අතර ඉක්මන් විසඳුම් ලබාදීමට ද එකඟ විය. නමුත් මේ දක්වා ලැබුණු විසඳුමක් නොමැත. මුදල් අමාත්‍යංශයේ බලධාරීන්ගේ මෙම අත්තනෝමතික හැසිරීම ඉතිහාසයේ කවර හෝ අවස්ථාවකවත් නොපැවති අන්දමේ දරදඬු තත්වයකි.

සේවක අභිප්‍රේරණය නිසි පරිදි සිදුනොවන, බලධාරීන්ගෙන් නිතරම කුඩම්මාගේ සැලකිලි හිමිවන සේවක ප්‍රජාවක් වන බැංකු සේවක අපහට අපගේ වෘත්තීය ජීවිතය ගැන මෙන්ම අපගේ බැංකුවල අනාගත යහපැවැත්ම පිළිබඳව ද ඇත්තේ සිහින රාශියක් පමණකි. එම සිහින කවර මොහොතක දී හෝ අදාළ බලධාරීන්ගේ හස්තයන්ට හසුවී සුනු විසුණු වනු නියතය. එබැවින් තවදුරටත් උදාසීනව බලාසිටීම නොව, එක්ව නැගී සිටිමින් සියලු බලවේගවලට එරෙහිව සවිඥානිකව පෙරට පැමිණීමේ කාලය උදා වී ඇත.

## මේ අරගලය අවැසිම මොහොතයි

රට තුළ කලින් කලට, පෙළින් පෙළට සිදුවන සිදුවීම් දාමය වත්මන් ආණ්ඩුව සහ පොදුවේ සියලුම දේශපාලන කණ්ඩායම් විසින් සිය දේශපාලන ගමන උදෙසා වාසි ලබාගැනීමට පමණක් භාවිත කිරීම පැහැදිලිව දක්නට ලැබෙන සත්‍යයකි. එම තත්වයන් බැංකු සේවකයාට පමණක් නොව රටේ පොදු මහජනතාවගේ හෙට දවසට ද නරක කල දසාවක් උදාකර දී හමාරය. ඒ හරහා කරලියට පැමිණෙන **ප්‍රතිත්‍රස්ත පනත** වැනි කම්කරු මර්දනකාරී අණපනත් හොර රහසේම රටතුළ ක්‍රියාත්මක කිරීමට රජය මේ වනවිටත් නිදහසේ කටයුතු කරමින් සිටී. ත්‍රස්තවාදය වැලැක්වීමේ මුවාවෙන් වැඩ කරන පංතියේ මිනිසුන්ගේ වෘත්තීය හා මානව නිදහස නිර්දය ලෙස මර්දනය කිරීමට, **රාජ්‍ය ත්‍රස්තවාදයට නීතිමය රාමුවක් ගෙන දීමේ රජයේ වැඩ පිළිවෙළ** අතිසාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් ඇත. කම්කරුවාගේ ආරක්‍ෂාව පිණිස ක්‍රියාත්මක වන කම්කරු අණ පනත් හාම්පුතුන්ගේ වාසියට අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම රිසි සේ සිදුවෙමින් පවතින අතර කම්කරු පන්තිය නියෝජනය කරන වෘත්තීය සමිති එම තත්වයන් පිළිබඳව දැනුවත් වන්නේ අදාළ සංශෝධනයන් පාර්ලිමේන්තුවේ සම්මත වීමෙන් අනතුරුවය. මෙය රටේ පවතින අරුම පුදුම ප්‍රජාතන්ත්‍රවාදයේ තවත් එක් පැතිකඩක් පමණි. එබැවින් සංගමය අරගලයට පිවිසෙන්නේ ඉතාමත්ම කාලෝචිත වූ අවස්ථාවකදීය.

මෙම අරාජික තත්වයන් හමුවේ බැංකු සේවක ප්‍රජාවගේ අනාගතය වෙනුවෙන් ලංකා බැංකු සේවක සංගමය හමුවේ මහත්වූ වගකීමක් ඇත. එසේම මෙවර අවදානම බැංකු සේවකයාට පමණක් නොව බැංකු පාලකයන් වෙත ද ඍජුවම එල්ල වී ඇති බව එම පාර්ශවයන් විසින් ද අවබෝධ කරගත යුතුව ඇත.

## සංගමය සටන් ක්‍රියාමාර්ග තීරණය කරයි

මෙම සියලු කරුණු සලකා බැලූ ලංකා බැංකු සේවක සංගමයේ විධායක සභාව 2019 ජුනි 12 දින රැස්වූ අතර එහිදී වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට අනුගතවීමට ඒකමතිකව තීරණය කරන ලදී. එහිදී මෙම ගැටලුවලට පිළිගත හැකි විසඳුම් ලබාදීමට අදාළ පාර්ශවයන් වෙත තවදුරටත් අවස්ථාවක් හිමිවන පරිදි සටන් ක්‍රියාමාර්ග අදියර 02 ක් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

### මුල් අදියරේ දී දියත් කෙරෙන ක්‍රියාමාර්ග

**2019 ජුනි 17** මාධ්‍ය හමුව

**2019 ජුනි 18** කොළඹ නගරයේ පෝස්ටර් ව්‍යාපාරය
දිස්ත්‍රික් නායක රැස්වීම
විවරණිකාවක් නිකුත් කිරීම

**2019 ජුනි 20** දිස්ත්‍රික් සංවිධාන ක්‍රියාකාරී රැස්වීම් - සියලු දිස්ත්‍රික් ආවරණය වන පරිදි

**2019 ජුනි 25-28**
රාජ්‍ය බැංකු : විශ්‍රාම ගැටලුව සම්බන්ධයෙන් විරෝධතා ලාංඡන පැළඳීම
පෞද්ගලික බැංකු : උපයන විට බදු ගැටලුව සම්බන්ධයෙන් විරෝධතා ලාංඡන පැළඳීම
සියලුම බැංකු : ජනතාව දැනුම්වත් කිරීමේ පත්‍රිකාවක් නිකුත් කිරීම

**2019 ජූලි 02** දිවයින පුරා පෝස්ටර් ව්‍යාපාරය

**2019 ජූලි 03** ප්‍රධාන නගර 24 ක පිකට් උද්ඝෝෂණ

**2019 ජූලි 08-12** කොළඹ නගරයේ ප්‍රධාන කාර්යාල ඉදිරිපිට පිකට් උද්ඝෝෂණ 05 ක්
ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව

**2019 ජූලි 10** තෝරාගත් උප නගරවල පිකට් උද්ඝෝෂණ

ජූලි මස අවසානයට පෙර යහපත් ප්‍රතිචාරයක් නොලැබෙන්නේ නම් **අඛණ්ඩ වැඩ වර්ජනයක් දක්වා වූ ඕනෑම ක්‍රියාමාර්ගයක්** ගැනීමට ද විධායක සභාව විසින් එහිදී ඒකමතිකව තීරණය කරන ලදී.

**ඒ අනුව දෙවන අදියරේ දී ක්‍රියාත්මක කිරීමට අදහස් කරන සටන් ක්‍රියාමාර්ග,**

**2019 ජූලි 08** විවරණිකාවක් නිකුත් කිරීම
**2019 ජූලි 08** මාධ්‍ය හමුවක් පැවැත්වීම
**2019 ජූලි 09** විධායක සභාවක් කැඳවීම
**2019 ජූලි 18** ප ව 03-15 ට සේවයෙන් බැහැරවීම
**2019 ජූලි 25** ප ව 12.30 ට සේවයෙන් බැහැරවීම
**2019 ජූලි 30** එක්දින වැඩ වර්ජනය හා මහා සාමාජික සභාව

ආරම්භක සටන් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අමාත්‍යංශ බලධාරීන් හා බැංකුවල පාලනාධිකාරීන් ද දැනුවත් කිරීමට කටයුතුකර ඇති බැවින් විසඳුම් නොපමාව ලබාදීම හරහා ආයතනවල කාර්මික සාමය ආරක්ෂා කිරීමේ වගකීම ඔවුන් සතුව පවතින බව ද අවධාරණය කර සිටිමු.

එසේම සංගම් නායකත්වය විසින් සියලුම ශාඛා සංගම් නායකත්වය, දිස්ත්‍රික් නායකත්වය සහ ශාඛා ක්‍රියාකාරීන් හරහා ඉදිරි සටන් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳව උපදෙස් සිය සාමාජිකත්වය වෙත ලබාදීමට කටයුතු කරනු ඇත. එම සටන් ක්‍රියාමාර්ගවලට සක්‍රීයව දායක වෙමින් බැංකු සේවකයාගේ අනාගතය වෙනුවෙන් වර්තමානයේ දී ඉටුකළ යුතු මෙහෙවර ඉටු කිරීමට සහෝදරත්වයෙන් පෙරට එන ලෙස ඉතා ඕනෑකමින් යුතුව ඉල්ලා සිටිමු. **වෙන්ව** විනාශය වැළඳ ගැනීමට නොව **එක්ව** නැඟී සිට සියලු අභියෝග ජයගැනීමට හැකි අභිමානවත් සාමාජික ශක්තියක් ලංකා බැංකු සේවක සංගමය සතුව ඇත. මෙය එම ශක්තිය උරගා බැලීමට කදිම අවස්ථාවක් කර ගනිමු.

**බැංකු සේවකයාගේ අනාගතය වෙනුවෙන් ජවයෙන් පෙරට එමු!**
**මේ අපේ ජය භූමියයි!**

**ලංකා බැංකු සේවක සංගමය දිගුකල් දිනේවා!**

මෙයට - සහෝදරත්වයෙන්

***චන්න දිසානායක***
සභාපති

2019 ජුනි 18 වැනි දින

***රන්ජන් සේනානායක***
ප්‍රධාන ලේකම්

## සංගමයේ වෙබ් අඩවිය

**මේ වනවිට සංගමයේ වෙබ් අඩවිය ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින් සංගමය පිළිබඳ තොරතුරු, සාමාජිකත්ව ඉල්ලුම්පත්, ශිෂ්‍යත්ව, මරණාධාර, මාතෘාදාරක වැනි ඉල්ලුම්පත් ආදිය සඳහා www.cbeu.lk වෙබ් අඩවියට පිවිසෙන ලෙස සහෝදරත්වයෙන් දන්වා සිටිමු.**